1 වාරය - පුනරීක්ෂණ(1)

✓ පෙළ පොත හෝ වෙනත් සුදුසු ඉගෙනුම් සම්පත් පරිශීලනයෙන් පහත ක්‍රියාකාරකම් සම්පූර්ණ කරන්න. අවශ්‍ය තැන්හි දී වැඩිහිටියෙකුගේ සහය ලබා ගන්න

1. සිසුන් පිරිසක් විසින් ලඳු කැලෑවක යෙදුණු ක්ෂේත්‍ර චාරිකාවක දී ඔවුන් විසින් හඳුනාගනු ලැබූ ශාක වර්ග කිහිපයක් සහ එම ශාක සංඛ්‍යාව පහත වගුවෙහි දක්වා ඇත.

ශාකයේ නම	තිතුල්	කජු	දං	කොට්ටම්බා	බෙදුරු	මඩු	මදු වැල්	නිදිකුම්බා
ශාක සංඛ්‍යාව	2	3	4	4	2	1	10	12

i) මෙහි අඩංගු දක්ත ස්තම්භ ප්‍රස්තාරයකින් නිරූපණය කරන්න.

ii) එම කැලෑවේ වැඩිපුරම හමුවූ ශාකය කුමක් ද?

iii) එම කැලෑවේ දක්නට ලැබුණු;

(a) දුර්වල කඳන් සහිත ශාකයක්

(b) අතු නොබෙදුණු කඳක් සහිත ශාකයක්

(c) පුෂ්ප හට නොගන්නා ශාකයක්

(d) තන්තු මූල පද්ධතියක් සහිත ශාකයක්

(e) සංයුක්ත පත්‍ර සහිත ශාක දෙකක්

(f) මකඳි සහිත ආවරණයක් ඇති ඵල සහිත ශාකයක්

(g) මූල ගැටිති සහිත ශාකයක් නම් කරන්න.

iv) a) ඉහත දක්වූ ශාක අතරින් ඒකබීජපත්‍රී හා ද්විබීජපත්‍රී ශාක දෙකක් තෝරා ලියන්න.

b) එම ශාක දෙකෙහි (a) පත්‍ර (b) කඳ (c) මුල් (d) බීජ අතර දක්නට ලැබෙන ප්‍රධාන වෙනස්කම් එක බැගින් ලියන්න.

1. ස්ථිති විද්‍යුත් ආරෝපණ භාවිතයට ගන්නා අවස්ථා දෙකක් ලියන්න.
2. ශිෂ්‍යයකු විසින් පිරිමැදීම මගින් ආරෝපණය කරගත් PVC දණ්ඩක් තූලකින් එල්ලා සේදවලින් පිරිමදින ලද වීදුරු දණ්ඩක් ඒ අසලට ගෙන එන ලදි. PVC දණ්ඩ ඉවතට තල්ලු වී යනු නිරීක්ෂණය විය.

i. PVC දණ්ඩ විකර්ෂණය වීමට හේතුව කුමක් ද ?

ii. PVC දණ්ඩ සතු ස්ථිති විද්‍යුත් ආරෝපණ වර්ගය කුමක් ද ?

3. පහත 2.16 රූපයේ දැක්වෙන්නේ එක්තරා ශිෂ්‍යයකු සැකසූ පරිපථයකි.

X අග්‍රය A ස්ථානයට සම්බන්ධ කළ විට මිලි ඇම්මීටරයේ කටුව චලනය වූ අතර, B ස්ථානයට සම්බන්ධ කළ විට නැවතත් චලනය විය. ඉහත සිදුවීම පැහැදිලි කරන්න. එම අවස්ථාවේ දැකිය හැකි තවත් නිරීක්ෂණයක් ලියන්න.



රූපය 2.17